**ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ පවත්වන සංස්කෘතික අධ්‍යාපන වැඩ පිළිවෙලට අදාල**

**කොන්දේසි මාලාව – 2010 - 2011**

1. සෑම සිකුරාදා දිනයකම පෙ.ව. 9.00 සිට දහවල් 12.45 දක්වා පංති පැවැත්වෙනු ඇත.

2. ඉහත සඳහන් කාලවේලාවන්ට අනුකූලව දරුවන් රැගෙන ඒම සහ රැගෙන යාම දෙමාපිය හෝ භාර කරුවන්ගේ වගකීමකි. දහවල් 12.45 ට කොන්සල් ජනරාල් කාර්යාලය වසා දමනු ලබනු අතර ඉන් අනතුරුව දරුවන්ගේ සම්පූර්ණ වගකීම දෙමාපියන් සතුවනු ඇත.

3. පංතියට ඇතුලත් කරණු ලබන්නේ 2010 අගෝස්තු මස 31 වන දිනට වයස අවුරුදු හය සම්පූර්ණ වන දූ දරුවන් හෝ පාසලේ 1 වන පංතියේ ඉගෙනුම ලබන දූ දරුවන් පමණි.

4. පිරිමි දරුවන් ජාතික ඇඳුමෙන් ඇඳුමෙන් සහ ගැහැණු දරුවන් ළමා සාරියෙන් සැරසී පංති වලට සහභාගි විය යුතුය.

5. නොකඩවා පංති වලට සහභාගී වීම අත්‍යවශ්‍ය වන අතර එසේ නොවන අවස්ථා වලදී වෙනත් දරුවකුට එම අවස්ථාව ලබා දෙනු ඇත.
   - දැනුම් දීමකින් තොරව නොකඩවා දින 3ක් පාසලට නොපැමිණෙණ දරුවන් පාසල හැරගියාසේ සලකනු ඇත. එම දරුවන් නැවට පාසලට ඇතුලත් කරවීමට අවශ්‍ය නම් මිලඟ පාසල් වාරයේදී අළුත් ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ යුතුය.

6. පාසල් / පුහුණු කටයුතු නොපැවැත්වෙන අවස්ථාවන්හිදී ඒ පිළිබඳ ලිඛිත දැන්වීමක් පාසල් පැවැත්වෙන දිනවලදී පැමිනෙණ ඔබගේ දූ දරුවන් මාර්ගයෙන් ඔබවෙත ලැබෙන්නට සලස්වනු ඇත. මෙයට අමතරව විද්‍යුත් තැපැල් (ඊ-මේල්) මගින්ද දන්වා එවනු ඇත. ඔබගේ දුරකථන අංකයන්, අන්තර්ජාල හා තැපැල් ලිපිනයන් ඉල්ලුම් පත්‍රය භාරදෙන අවස්ථාවේදී සඳහන් කිරීමද, ඒවායෙ කිසියම් වෙනස් කමක් සිදුවන අවස්ථා වලදී නොපමාව ඒ පිළිබඳව දැනුම් දීමද දෙමව්පියන් සතු වගකීමක් වනු ඇත.

7. දරුවාගේ හෝ වෙනත් ඕනෑම කටයුත්තක් සඳහා ඇතුළු විය හැක්කේ පාසල් කාර්යාල සීමාවට පමණි. පංති පැවැත්වෙන සීමාවන්ට ඇතුළුනොවිය යුතුය.

8. දෙමාපියනට ගුරුතුමා හෝ ගුරුතුමිය හමුවී තම දරුවාගේ අධ්‍යාපන කටයුතු විමසීම කල හැක්කේ දහම් පාසල් කාර්යාලය හරහා දහම් පාසල් පාලන මඩුල්ල හමුවේ පමණි. දහම් පාසලේ හෝ එයට අනුබද්ධ කිසිම කාර්යයක් සඳහා ගුරු මණ්ඩලයේ මහත්ම මහත්මීන්ට දුරකථන ඇමතුම් දී විමසීම් කිරීම් වලින් වලකින්න.

9. දරුවා ඇතුලත් කිරීමේදී ඔබ දරුවාට ලබාදෙන දහම් පාසල් ශිෂ්‍ය වාර්තා පොත ප්‍රවේශමෙන් පරිහරණය කර සුරැකිව තබා ගන්න.

10. තම දූ දරුවන් රැගෙන එන, රැගෙන යන සහ වැඩසටහන් පැවැත්වෙන වේලාවන් තුළදී කොන්සල් ජනරාල් කාර්යාලය ඉදිරිපිට අනවශ්‍ය ලෙස රැසිවීම සහ ඒ අවට ගැවසීමෙන් වැලකිය යුතු අතර කොන්සල් ජනරාල් කාර්යාල අසල තම වාහන නැවැත්වීමේදී අවට නිවැසියනට සහ මාර්ගයේ ධාවනය වන වාහන වලට අවහිර නොවන අයුරින් කටයුතු කළ යුතුය.

11. අවශ්‍ය පරිදි විවේක කාලයේදී අනුභවය සඳහා ආහාරයක් සහ බීමක් දූ දරුවන් රැගෙන එන්නේනම් එවැනි පාර්සල් වල අනිවාර්යයෙන්ම දරුවාගේ නම සඳහන් කළ යුතුය.

12. සිකුරාදා දිනවල වැඩසටහන් සම්පන්ධකරණය කිරීමේ වගකීම භාරව කටයුතු කරන අයට එම කටයුතු සඳහා දෙමව්පියන්ගේ සම්පූර්ණ සහයෝගය ලබා දිය යුතුය.

** **<u>වැදගත්:</u>** මෙම කොන්දේසි මාලාව අවශ්‍යවූ විටකදී වෙනස් කිරීම් කරණු ඇත. එම අවස්ථාවන්හිදී දෙමාපිය / භාරකරුවන් වෙත දන්වා අවනු ඇත.

භාෂා කේන්ද්‍රය මගින් පනවා ඇති නීති රීති වලට එකග වන බව සහතික කරමි.

------------------------------------------------------ ------------------------------------------------

මව / පියා / භාරකරුගේ අත්සන දිනය

# ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ පවත්වන සංස්කෘතික අධ්‍යාපන වැඩ පිළිවෙල සඳහා

## අයදුම් පත්‍රය -- 2010 - 2011

ශිෂ්‍යය / ශිෂ්‍යාවගේ විස්තර

1 සම්පූර්ණ නම : ____________________

1.1 Name in English : ____________________

2 උපන් දිනය : ____________________

3 දැනට ඉගෙනුම ලබන පාසල : ____________________

3.1) දැනට ඉගෙනුම ලබන පන්තිය : ____________________

4 භාෂා දැනුම

| | හොඳයි | සාමාන්‍යයි | දුර්වලයි |
|---|---|---|---|
| සිංහල : | ☐ | ☐ | ☐ |

5 පදිංචි එමීරය : ____________________

මව / පියා / භාරකරුගේ විස්තර

1 නම : ____________________

2 ලිපිනය : ____________________

3 දුරකතන අංක : ____________________

අ) කාර්යාලය ____________ ආ) නිවස ____________ ඇ) ජංගම ____________

ආ) අන්තර්ජාල ලිපිනය (E mail) ____________________

ඉ) හදිසි අවස්ථාවකදී දැනුම් දීමට (දෙමාපියන් හැර) වෙනත් අයෙකුගේ

නම : ____________________ දුරකතන අංකය : ____________

කරුණාකර අමුනා ඇති කොන්දේසි පත්‍රිකාව කියවන්න.
භාෂා කේන්ද්‍රය මගින් පනවා ඇති නීති රීති වලට එකඟ වන බව සහතික කරමි.

____________________ ____________

මව / පියා / භාරකරුගේ අත්සන දිනය

- **දරුවාගේ වයස 2010 අගෝස්තු මස 31 වන දිනට අවු 06 ට අඩුනම්, දිනපතා යන පාසලේ 01 වන ශ්‍රේණියේ හෝ ඉහල ශ්‍රේණියක අධ්‍යාපනය ලබන බවට පාසැලෙන් ලබාගත් සහතිකයක්,**
- **දරුවාගේ ගමන් බල පත්‍රයේ** (passport) **පිටු අංක 02 චායා පිටපතක්,**
- **අත්සන් කරන ලද නීති මාලාව,**

**ඉහත සඳහන් ලිපි ලේඛණ අවශ්‍යබව කරුණාවෙන් සලකන්න.**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි. අනු අංකය :